ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථානුකූල ගුරු කාර්යක්ෂමතා කඩඉම - 03

# ක්‍රියාමූලික පර්යේෂණ

මොඩියුල අංක 10

ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ඉසුරුපාය

බත්තරමුල්ල

## ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථානුකූල ගුරු කාර්යක්ෂමතා කඩඉම - 03

## ක්‍රියාමූලික පර්යේෂණ

## මොඩියුල අංක - 10

| **මොඩියුලයේ නම** | **ක්‍රියාමූලික පර්යේෂණ** |
|---|---|
| **මොඩියුලයේ අරමුණු** | 1. ගුරුවරයකු විසින් තම වෘත්තීය ජීවිතය සාර්ථක ව පවත්වා ගෙන යාම සඳහා දැන සිටිය යුතු ව්‍යවහාරික පර්යේෂණ වර්ග හතරක් පිළිබඳ ව වැඩිදුරටත් තොරතුරු අධ්‍යයනය කිරීම.<br>2. දෛනික ව හමු වන විවිධ ගැටලු විසඳීම සඳහා යොදා ගත හැකි වඩාත් සුදුසු පර්යේෂණ වර්ගය තෝරා ගැනීමේ හැකියාව ලබා ගැනීම.<br>3. ක්‍රියාමූලික පර්යේෂණ, අනිකුත් පර්යේෂණවලින් වෙනස් වන ආකාරය පැහැදිලි කර ගැනීම.<br>4. ක්‍රියාමූලික පර්යේෂණවල ලක්ෂණ අවබෝධ කර ගැනීම.<br>5. ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාවලිය තේරුම් ගැනීම.<br>6. ක්‍රියාමූලික පර්යේෂණවල අඩංගු විය යුතු පියවර ද, පියවර අඩංගු ක්‍රියාවලිය ද පදනම් කර ගෙන, ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාවලිය සුබනම්‍ය ව ක්‍රියාත්මක කළ හැකි ආකාරය අවබෝධ කර ගැනීම.<br>7. ක්‍රියාමූලික පර්යේෂණ, වෘත්තීය සංවර්ධනයට බලපාන ආකාරය ප්‍රායෝගික ව තේරුම් ගැනීම.<br>8. ප්‍රත්‍යවේක්ෂණයේ තෙයාකාර රටා (සම කාලින, පශ්චාද්, අනාගත ක්‍රියා) හඳුනා ගෙන ස්වකීය ගුරු වෘත්තීය සංවර්ධනයට ප්‍රත්‍යවේක්ෂණය අදාළ කර ගත හැකි ආකාරය තේරුම් ගැනීම.<br>9. ක්‍රියාමූලික පර්යේෂණවලට ප්‍රත්‍යවේක්ෂණය සම්බන්ධ වන ආකාරය තේරුම් ගැනිම.<br>10. ක්‍රියාමූලික පර්යේෂණයෙන් ස්වයං සංවර්ධනය ද, ස්වකීය සේවා දායකයන්ගේ සංවර්ධනය ද අධ්‍යාපන පද්ධතියේ සංවර්ධනය ද වන ආකාරය තේරුම් ගැනීම.<br>11. ක්‍රියාමූලික පර්යේෂණයක්, පාසල් පන්ති කාමරය පදනම් කර ගෙන කිරීම සඳහා, උචිත ගැටලුවක් හඳුනා ගෙන, ඒ අනුව ක්‍රියාමූලික පර්යේෂණය සැලසුම් කර පර්යේෂණ යෝජනා ලිවීම පිළිබඳව දැනුමක් ලබා ගැනීම.<br>12. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ශිෂ්‍යයා මුහුණ දෙන ගැටලු, ක්‍රියාමූලික පර්යේෂණයක් ඇසුරින් විසඳාගත හැකි ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනිම.<br>13. ක්‍රියාමූලික පර්යේෂණයක් සිදුකර පර්යේෂණ වාර්තා ලිවීම පිළිබඳ දැනුවත් වීම.<br>14. අන්තර්ජාතික ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාකාරකම්වලට ගුරුවරුන්ට සම්බන්ධ විය හැකි ආකාරය අවබෝධ කර ගැනීම. |

| | |
|---|---|
| **අපේක්ෂිත ඉගෙනුම් පල** | 1. ගුරුවරයකු වෘත්තීය ජීවිතය සාර්ථක ව පවත්වා ගෙන යාම සඳහා දැන සිටිය යුතු ව්‍යවහාරික පර්යේෂණ වර්ග පහක් විස්තර කරයි. (ක්‍රියාමූලික පර්යේෂණ, සමීක්ෂණ, සම්පරීක්ෂණ, ප්‍රත්‍යෙක අධ්‍යයන, අන්වායාම අධ්‍යයන).<br>2. දෛනික ව හමු වන විවිධ ගැටලු විසඳීම සඳහා යොදා ගත හැකි වඩාත් සුදුසු පර්යේෂණ වර්ගය තෝරා ගනියි.<br>3. ක්‍රියාමූලික පර්යේෂණ, අනිකුත් පර්යේෂණවලින් වෙනස් වන ආකාරය තේරුම් ගෙන පැහැදිලි කරයි.<br>4. ක්‍රියාමූලික පර්යේෂණවල ලක්ෂණ පැහැදිලි කරයි.<br>5. ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාවලිය පැහැදිලි කරයි.<br>6. ක්‍රියාමූලික පර්යේෂණවල අඩංගු විය යුතු පියවර දැන ගෙන, ක්‍රියාමූලික පර්යේෂණයක් සුබනම්‍ය ව ක්‍රියාත්මක කරන ආකාරය විස්තර කරයි.<br>7. ක්‍රියාමූලික පර්යේෂණ, වෘත්තීය සංවර්ධනයට බලපාන ආකාරය විස්තර කරයි.<br>8. ප්‍රත්‍යවේක්ෂණයේ තෙයාකාර රටා (සම කාලීන, පශ්වාද්, අනාගත ක්‍රියා) තේරුම් ගෙන ඒවා ක්‍රියාමූලික පර්යේෂණවලට සම්බන්ධ වන ආකාරය විස්තර කරයි.<br>9. උචිත ගැටලුවක් හඳුනා ගෙන, ඒ අනුව ක්‍රියාමූලික පර්යේෂණය සැලසුම් කර පර්යේෂණ යෝජනාව ලියන ආකාරය පැහැදිලි කරයි.<br>10. ක්‍රියාමූලික පර්යේෂණයක් සිදු කළ පසු ඒ ඇසුරින් පර්යේෂණ වාර්තාවක් ලියන ආකාරය පිළිබඳ හැකියාව ලබා ගනියි.<br>11. අන්තර්ජාතික ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ විය හැකි ආකාරය අවබෝධ කර ගෙන විස්තර කරයි. |
| **මොඩියුලයේ අන්තර්ගතය** | 1. වෘත්තීය ජීවිතය සාර්ථක ව පවත්වා ගෙන යාම සඳහා දැන සිටිය යුතු ව්‍යවහාරික පර්යේෂණ වර්ග හතර (සමීක්ෂණ, සම්පරීක්ෂණ, ප්‍රත්‍යෙක අධ්‍යයන, අන්වායාම අධ්‍යයන) ක්‍රියාත්මක කරන ආකාරය සහ ඒ සඳහා උදාහරණ ලෙස ගත හැකි පර්යේෂණ ලිපි<br>2. ක්‍රියාමූලික පර්යේෂණ, අනිකුත් පර්යේෂණවලින් වෙනස් වන ආකාරය.<br>3. ක්‍රියාමූලික පර්යේෂණවල ලක්ෂණ<br>4. ක්‍රියාමූලික පර්යේෂණවල ක්‍රියාවලිය<br>5. ක්‍රියාමූලික පර්යේෂණවල පියවර<br>6. ක්‍රියාමූලික පර්යේෂණ, වෘත්තීය සංවර්ධනයට බලපාන ආකාරය<br>7. ප්‍රත්‍යවේක්ෂණයේ තෙයාකාර රටා (සම කාලීන, පශ්වාද්, අනාගත ක්‍රියා) හා ක්‍රියාමූලික පර්යේෂණවලට ප්‍රත්‍යවේක්ෂණය සම්බන්ධ වන ආකාරය<br>8. ස්වකීය පන්ති කාමර භූමිකාව පදනම් කර ගෙන ක්‍රියාමූලික පර්යේෂණයක් කිරීමේ කුසලතා<br>9. ක්‍රියාමූලික පර්යේෂණයෙන් ස්වයං සංවර්ධනය ද, ස්වකීය සේවා දායකයන්ගේ සංවර්ධනය ද අධ්‍යාපන පද්ධතියේ සංවර්ධනය ද වන ආකාරය<br>10. පාසල් පන්ති කාමරය පදනම් කර ගෙන උචිත ගැටලුවක් හඳුනා ගෙන ක්‍රියාමූලික පර්යේෂණයක් සැලසුම් කර පර්යේෂණ යෝජනාව ලිවීම<br>11. ක්‍රියාමූලික පර්යේෂණයක් සිදු කර පර්යේෂණ වාර්තාව ලිවීම<br>12. අන්තර්ජාතික ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ විය හැකි ආකාරය අවබෝධ කර ගෙන ඒ සඳහා සහභාගි වීමට අවස්ථා සම්පාදනය |

| | |
|---|---|
| | ඉහත අන්තර්ගතයට අදාළ ව වැඩිදුර අධ්‍යයනය නිර්දේශ කෙරේ. |
| **ඉගෙනුම් ක්‍රමවේදය** | • ස්වයං අධ්‍යයනය<br>• සුනම්‍ය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය |
| **පරිශීලක ද්‍රව්‍ය සඳහා යොමුව** | කුමාරි, ජී.එම්.ආර්.ඩී. සහ විජේසුන්දර, එස්. (2018). පාඨමාලා සහභාගිකයන්ගේ අධිප්‍රජානන සම්ප්‍රජානනය. අධ්‍යාපන පර්යාලෝක. 7 වන වෙළුම, *1* වන කලාපය, ජනවාරි. 82-103 වන පිටු. Policy and Publications – MOE<br>කොඩිතුවක්කු, ජී. (2020). පර්යේෂණ ක්‍රියාවලිය හඳුනා ගනිමු. බත්තරමුල්ල: පර්යේෂණ සහ සංවර්ධන ආයතනය.<br>කොඩිතුවක්කු, ජී. සහ පුෂ්පමාලා, එස්. (2013). *අධ්‍යාපන පර්යේෂණකරණයේ දී පර්යේෂණ යෝජනාවක් ලිවීමට උපදෙස්.* මහරගම: ජාතික අධ්‍යාපන ආයතනය.<br>කොඩිතුවක්කු, ජී., විජයකෝන්, සී., සහ සමරවික්‍රම, වයි. (2017). *මම ක්‍රියාමූලික පර්යේෂකයෙක් වෙමි.* කුරුණෑගල: වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව. ([https://drive.google.com/drive/ folders/](https://drive.google.com/drive/folders/)1b4lm-6rD2U7wJTZ2UsoW1pDwgZkz90K-?usp =sharing)<br>කොඩිතුවක්කු, ජී. සහ දිසානායක, එන්. ඩී. (2006). ශ්‍රී ලාංකික ළමයා අවබෝධ කර ගැනීම. පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. (HYPERLINK "https://drive. google. com/drive/folders/1b4lm-6rD2U7wJTZ2UsoW1pDwgZkz90K-usp=sharing"<br>An example for longitudinal research -https://drive.google. com/file/d/1Bsc5mIY8zmHU-UvbFUhupyasf6fJx9oe/ view ?usp=sharing<br>*ගුරු සහ ගුරු උපදේශකවරුන්ගේ ක්‍රියාමූලික පර්යේෂණ 40ක්* (http:// research.nie.ac.lk/nie/Pages/Auth_3.jsp)<br>ප්‍රේමසිරි, කේ.ඒ.ඒ.ඩී.එන්. (2013). පාසල් වැසී යාමට හේතු. *අධ්‍යාපන පර්යාලෝක. 2 වන වෙළුම, 1 වන කලාපය*, ජනවාරි. 61-76 වන පිටු. Policy and Publications – MOE<br>ලලිතධීර, කේ.ඒ. (2018). පර්යේෂණ ක්‍රමවේදය සහ ක්‍රම. මහරගම: එල්.එම්.ඩී. ප්‍රකාශකයෝ.<br>විජේරත්න, එච්.ඒ.ඩී.ටී. සහ විතාරණ, පී.ආර්.කේ.ඒ. (2020). ජ්‍යාමිතිය සංකල්ප ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අධිප්‍රජානන උපායමාර්ග භාවිතය පිළිබඳ |

අධ්‍යයනයක්. ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ වාර සඟරාව, *16* වන වෙළුම, 68-98 වන පිටු. පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. http://research.nie.ac.lk/doc/103.pdf **(https://drive.google.com/drive/folders/1b4lm-6rD2U7wJTZ2UsoW1pDwgZkz90K-?usp=sharing )**

Fish, D., & Twinn, S. (1997). *Quality clinical supervision in the health care professions: Principled approaches to practice*. Nursing Management**. 3, 9, 26-26.** doi: **10.7748/nm.3.9.26.s30.**

Killion, J.P. & Todnem, G.R. (1991). A process for personal theory building. *Educational Leadership,* XLVIII (6), 14-16.

Schön D.A. (1987). *Educating the reflective practitioner: Toward a new design for teaching and learning in the professions.* Jossey-Bass: San Francisco.

Spalding N.J. (1998). Reflection in professional development: a personal experience. *British Journal of Therapy and Rehabilitation,* 5(7), 379-82.

Tickle, L. (1994). *The introduction of new teachers.* London: Castell.

පර්යේෂණ ග්‍රන්ථ, ප්‍රධාන පුස්තකාල - ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම සහ අධ්‍යාපන නායකත්ව සංවර්ධ මධ්‍යස්ථානය, මීපේ

ඉහත අන්තර්ගතයට අදාළ ව වැඩිදුර අධ්‍යයනය නිර්දේශ කෙරේ.